# තිසදිගේ මල් පැළය



දුලංගයා තිසදි දිසානායක

**තිසදිගේ මල් පැළය**

**දුලංගයා තිසදි දිසානායක**

**පළමු මුද්‍රණය**

**2023 - සැප්තැම්බර් මස**

# පිදුම

මාගේ

පන්තිභාර ගුරු මෑණියන් වන

ප්‍රමිතා වෙත්තසිංහ ගුරුමෑණියන්ට ද,

මාගේ දයාබර දෙමව්පියන්ට ද

ගෞරවයෙන් පුද කරමි.

# ස්තුතිය

ශිල්ප හදාරන අනාගත මල් කැකුළු වලට

ග්‍රන්ථ  රචනා කිරීමට

මඟ විවර කළ

මහාමායා බාලිකා විදුහලේ  විදුහල්පතිතුමියන්ට

ප්‍රාථමික අංශයේ නියෝජ්‍ය විදුහල්පතිතුමියට,

නිවැරදි ලෙස ග්‍රන්ථකරණයට මඟ පෙන් වූ

ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මෑණියන්ට,

නිබඳව සෙවනැල්ලක් ලෙස සිටින,

මාගේ දයාබර දෙමාපියන්ට ද,

ග්‍රන්ථකරණයට දිරිමත් කළ සෑම දෙනාට ද,

ගෞරවාන්විත ස්තූතිය පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරිමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂි ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමණාකරන මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට පිවයක් වූ සෙනෙවිරත්න මහලේකම් ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර.
2023.10.20

එකමත් එක කාලෙක පුංචි බබෙක් හිටියා. ඒ බබාගේ නම තමයි තිසදි.






තිසදි හොඳ ළමයෙක්. එයා, අම්මයි, අප්පච්චියි කියන දේ හොඳින් අහනවා. ඉගෙන ගන්නත් දක්ෂයි.




තිසඳි මල්වලටත් හරිම ආසයි. එයාගේ ගෙදර වත්තේ පාට පාට මල් ගොඩයි.

රෝස පාට, කහ පාට, සුදු පාට වගේ හැම පාටම මල් පිපිලා තියෙනවා. හරිම සුවඳයි.



සමනල්ලු හරිම සතුටින් ඒ
මල්වල පැණි බොන්න එනවා.

තිසදි එයාගේ අම්මයි, අප්පච්චී එක්ක පුංචි අම්මාගේ ගෙදර ගියා.



එහෙ ගිහින් එන ගමන්, මල් පැළ විකුණන නැන්දා කෙනෙක් ඉන්න කඩයක් දැක්කා.



“අම්මේ, මට අර මල් පැළේ ඇරන් දෙන්නකෝ.” තිසදි කිව්වා.



අප්පච්චී කාර් එක නතර කළා. තිසද්‍රි,
අම්මත් එක්ක මල් පැළ කඩේට ගියා.



තිසදි අම්මට කියලා පිච්ච මල් පැළයක් ගත්තා. තිසදිට හරිම සතුටුයි.



තිසදි ගෙදර ගියා. ගෙදර මිදුලේ පිච්ච පැළය හිටෙව්වා. අප්පච්චීයි, අම්මායි පැළය හදන්න උදවු කළා.





තිසදි හැමදාම පැළේට වතුර දැම්මා.
පැළේ ටික ටික ලොකු වුණා.

දවසක් ඒ පිච්ච වැලේ මල් පොහොට්ටු ඇවිල්ලා තිබුණා.





එදා සවස් වනවිට පිච්ච
වැලේ මල් පිපිලා
තිබෙන හැටි තිසදි
දැක්කා. මුළු මිදුලම
පිච්ච මල් සුවඳින්
පිරිලා. තිසදිට හරිම
සතුටක් වගේ ම එයා
ගැන ආඩම්බරයකුත්
ඇති වුණා.

තිසදි පිච්ච වැලෙන් මල් ටිකක් කඩලා බුදු සාදුට පූජා කළා.



පිච්ච වැලටත් මල් ටිකක් ඉතුරු කරලා මල් කඩන්න තිසදි අමතක කළේ නෑ.

තිසදිගේ මේ ක්‍රියාව දැකලා අම්මාටයි, අප්පච්චීටයි තිසදි ගැන ආඩම්බරයක් ඇති වුණා.





පුංචි අපිත් තිසදු  වගේ ගස් වලින් මල් කඩද්දී, ඒ ගස් වැල් වලටත් මල් ඉතුරු කරලා කඩා ගනිමු. එහෙම කළාම, ඒ මල් වලට එන සතුන්ට ආහාර නැති වෙන්නෙත් නැහැ. ඒ  වගේම ගස්වැල් වල මල් පිපිලා තියෙද්දී ඒවා හරිම ලස්සනයි.

දුලංගයා තිසදි දිසානායක
**2 ශ්‍රේණිය D**
මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර

# පසුවදන

නුතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවිම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මුලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ  මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට  ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන  ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට
යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
**2023.10.20**

ISBN 978-624-206-909-8